ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන - 2022/2023
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023
SNU6620/ESU4220 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපන තාක්ෂණය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.02 | වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

උපදෙස් -

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. 1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලට ද 2 වන කොටසින් ප්‍රශ්න (2) දෙකකටද 3 වන කොටසින් ප්‍රශ්න දෙකකටද (2) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01.

(i) අධ්‍යාපනික තාක්ෂණය (ET) යන සංකල්පය උදාහරණ දෙකක් (02) සමඟින් නිර්වචනය කරන්න.

(ii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ 'තොරතුරු තාක්ෂණය' සහ 'සහායක තාක්ෂණය' අතර වෙනස්කම් පහක් (05) සඳහන් කරන්න.

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන්ගේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලියේ දී අන්තර්ජාලයේ ප්‍රයෝජන පහක් (05) නම් කරන්න.

(iv) ගුරුවරයෙකුගේ සම්ප්‍රදායික ගුරු භූමිකාවට සාපේක්ෂව පහසුකම් සපයන්නෙකු ලෙස නූතන ගුරු භූමිකාවේ වැදගත්කම් තුනක් (03) පැහැදිලි කරන්න.

(v) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට ඉගැන්වීමේ දී ගවේශණ ඉගෙනුම් ක්‍රමයේ අවාසි පහක් (05) උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(vi) ගැටළු විසඳීමේ ක්‍රමය ආශ්‍රිත ක්‍රියාවලි දෙකක් (02) සඳහන් කර එක් ක්‍රියාවලියක පියවර හතරක් (04) ලියන්න.

(vii) අන්තර්කරණ පන්ති කාමරයක කණ්ඩායම් වශයෙන් ඉගැන්වීමේ ප්‍රතිලාභ පහක් (05) පැහැදිලි කරන්න.

(viii) අන්තර්කරණ පන්තිකාමරයක ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමවල වැදගත්කම් පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05x 08 = 40)

## 2 වන කොටස

02. (i) ව්‍යාපෘති ක්‍රමයේ සාමාන්‍ය පියවර හතර (04) නම් කරන්න. ඒවායින් දෙකක් (02) උදාහරණ සමඟින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) අන්තර්කරණ පන්තිකාමරවල උගන්වන ගුරුවරුන් සඳහා ව්‍යාපෘති ක්‍රමයේ වාසි සහ අවාසි පහක් (05) පරීක්ෂා කරන්න. (ලකුණු 08)

03. (i) පැවරුමක ප්‍රධාන අංග හතරක් **(04)** සහ පැවරුම්වල ප්‍රධාන ලක්ෂණ හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 07)

(ii) අවම වශයෙන් විවිධ වර්ගයේ පැවරුම් පහක් **(05)** ඇගයීමට ලක් කර සහ එම පැවරුම් අන්තර්කරණ පන්තිකාමරයක භාවිතා කළහැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

04.(i) ඔබ මස්තිෂ්ක ආඝාතය සහිත සිසුවකුගේ ගුරුවරයකු යැයි සිතන්න. ඔබ පාඩම් සැලසුම් සකස් කිරීමේ දී සලකා බැලිය යුතු වැදගත් සාධක පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 07)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔටිසම් පරාසීය අක්‍රමතාව සහිත සිසුන්ගේ පන්තිභාර ගුරුවරයකු ලෙස ඔවුන්ව සවිබල ගන්වන්නේ කෙසේදැයි උදාහරණ තුනක් **(03)** ලබාදෙමින් පරීක්ෂා කරන්න. (ලකුණු 08)

05. (i) අන්තර්කරණ පන්තිකාමරයක ඉගැන්වීම් ආධාරක තෝරා ගැනීමේ දී ගුරුවරයකු ලෙස සැලකිය යුතු වැදගත් කරුණු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) අන්තර්කරණ පන්ති කාමරයක් තුළ දී ඉගෙනුම් ආධාරක ඵලදායී ලෙස භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳ කරුණු තුනක් **(03)** ඇසුරෙන් විමර්ශනය කරන්න. (ලකුණු 08)

## 3 වන කොටස

06. (i) ඔබ උගන්වන ඕනෑම ශ්‍රේණියකින් සහ විෂයකින් පාඩමක් තෝරන්න. විනාඩි 40 ක් සඳහා පාඩම් සැලැස්මක් සකස් කරන්න. පන්ති කාමරයේ ADHD රෝග විනිශ්චය සහිත එක් දරුවකු සමඟ සිසුන් 30 ක් සිටින බව සලකන්න. (ලකුණු 08)

(ii) ADHD සහිත දරුවාට ඉගැන්වීම සඳහා පාඩම් සැලැස්මේ ක්‍රියාකාරකම් අනුවර්තනය කර එවැනි ක්‍රියාකාරකම් අනුවර්තනය කිරීමේ දී ඔබ සලකා බැලූ සාධක මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 07)

07.(i) පූර්ණ අන්ධතාව සහිත සිසුන් සඳහා භාවිතා කළ හැකි සහයක තාක්ෂණික උපාංග පැහැදිලි කර උපකරණයක් සහ ශිල්පීය ක්‍රමයක් ලෙස තාක්ෂණයේ ප්‍රතිලාභ සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(ii) පහළ තාක්ෂණික, මධ්‍ය තාක්ෂණික සහ අධි තාක්ෂණික උපකරණ හෝ උපාංග එක් එක් වර්ගය සඳහා උදාහරණ තුනක් **(03)** ලබා දෙමින් විස්තර කරන්න. (ලකුණු 08)

08.(i) උග්‍ර දුබලතා සහිත දරුවන් සඳහා පුද්ගලානුබද්ධ අධ්‍යාපනික වැඩසටහන් (IEP) ක්‍රියාත්මක කිරීමේ පියවර පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) පුද්ගලානුබද්ධ අධ්‍යාපනික වැඩසටහන් (IEP) සංවර්ධනය කිරීමට පෙර දරුවකුගේ විවිධ හැකියාවන් තීරණය කිරීම සඳහා විවිධ මූලාශ්‍රවලින් තොරතුරු රැස් කිරීමේ වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 08)

09. (i) රේඛීය ප්‍රක්‍රම ඉගෙනීමෙහි ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(ii) බුද්ධිමය දුබලතා සහිත සිසුන්ගේ ඉගෙනීම දිරිමත් කිරීම සඳහා ප්‍රකම ඉගෙනුම් ක්‍රමයේ වටිනාකම අගයන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.